# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2155/3 - 2019 දෙසැම්බර් මස 23 වැනි සඳුදා - 2019.12.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/13/09/2009

### කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.10.20 දින දරන නියෝගයෙන්, බේරුම්කිරීම මගින් විසඳීම සඳහා යොමු කරනු ලැබූ කුරුවිට, අලුත් මල්කඩුවාව හිග්ගස්හේන, පුෂ්පසිරි, ඒ. එම්. ඩී. ජී. ධනුෂ්ක මහතා සහ කොළඹ 03, ආර්. ඒ. ද මැල් මාවතේ, අංක 10හි පිහිටි රෝයල් පෝසිලේන් (පුද්ගලික) සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් මා වෙත ලබාදෙන ලද අංක ඒ 3413 දරන ප්‍රදානය 2011.10.28 දිනැති හා අංක 1729/22 දරන රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලදී.

එම ප්‍රදානය සම්බන්ධයෙන් කාර්මික ආරාවුල් පනතේ 34 වගන්තිය යටතේ බේරුම්කරු විසින් මා වෙත ලබා දී ඇති 2019.11.21 දිනැති අර්ථ නිරූපණය එම පනතේ 18(1) වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 දෙසැම්බර් මස 04 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

*යොමු අංකය* : IR/13/09/2009

කාර්මික අධිකරණය

ඒ. එම්. ඩී. ජී. ධනුෂ්ක මහතා,
''පුෂ්පසිරි'',
හිග්ගස්හේන,
අලුත් මල්කඩුවාව,
කුරුවිට.

නඩු අංකය : A 3413 — *පළමු පාර්ශවය*

සහ

රෝයල් පෝසිලේන් (පුද්ගලික)
සමාගම,
අංක 10,
ආර්. ඒ. ද මැල් මාවත,
කොළඹ 03.

*දෙවන පාර්ශවය*

අතර පවත්නා කාර්මික ආරවුල

### ප්‍රදානය (අර්ථ නිරූපන)

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ගාමිණි ලොකුගේ මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2011.10.20 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත් කොට මා වෙත යොමුකර ඇත.

ඒ අනුව මා විසින් 2019.06.27 දින ලබා දුන් ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2137/7 හා 2019 අගෝස්තු මස 19 දින *ගැසට් පත්‍රයේ* පළ කර ඇති අතර 1950 අංක 43 දරන (සංශෝධිත) කාර්මික ආරවුල් පනතේ 34 වගන්තිය ප්‍රකාරව අර්ථ නිරූපනයක් සඳහා මා වෙත යොමු කර ඇත. ඒ අනුව අර්ථ නිරූපනය පහත පරිදි වේ.

එම ප්‍රදානය අනුව ගෙවිය යුතු සම්පූර්ණ මුදල 2019.12.31 දිනට ප්‍රථම පානදුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කරන ලෙස මෙයින් නියෝග කරමි. මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

01 - 283

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.